www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඔබාමාගේ ප්‍රතිගාමීන් කන්ඩායම

## Obama's Team of Reactionaries

**2008 දෙසැම්බර් 8**

මෑත සති ගනනාව තුල දී, මාධ්‍ය විවරන ගනනාවක් ම ජනාධිපති ලෙස තේරී පත්ව ඇති බරක් ඔබාමා සිය කැබිනට් මන්ඩලයට තෝරා ගෙන ඇති කන්ඩායමට “ප්‍රතිවාදීන්ගේ කන්ඩායම” යනුවෙන් සැඳහුම් කර තිබේ. මෙම සැඳහුම සම්බන්ධිත වන්නේ, 1860 මැතිවරනයෙන් ජය ලැබීමෙන් පසුව, බෙදී වෙන්වීමේ අර්බුදයට ද අනතුරුව සිවිල් යුද්ධයට ද මුහුන දුන් තතු යටතේ ඒබ්‍රහම් ලින්කන් ප්‍රධාන කැබිනට් තනතුරු සඳහා තෝරා ගත් කන්ඩායම අරබයා ඉතිහාසඥ ඩොරිස් කියර්න්ස් ගුඩ්වින් එනමින් ලියූ ග්‍රන්ථයකට ය.

මාධ්‍ය ලින්කන්ගේ හා ඔබාමාගේ කැබිනට් මන්ඩල අතර කරන සන්සන්දනය පදනම් විරහිත එකක් වන අතර එය ඓතිහාසික නොදැනුවත්කමේ හා දේශපාලනික නොබැරෑරුම් භාවයේ සංයෝජනයක් පෙන්නුම් කරයි. මෙම සාවද්‍ය සමානකරනය දේශපාලන ක්‍රියාකාරිත්වයන් දෙකකට සේවය කරයි. ප්‍රථම කොටම, එය, විදේශයන් සම්බන්ධයෙන් මිලිටරිවාදය සහ රට තුල පටි තද කර ගැනීමේ පිලිවෙත් ඉල්ලා සිටින පුද්ගලයන්ගෙන් පරිපූර්න වසයෙන් ම සමන්විත, ඔබාමා කැබිනට් මන්ඩලයට තෝරා ගත් කන්ඩායම මගින්, තථ්‍ය වසයෙන් ම, බොරුවක් බවට පත් කෙරී ඇති ප්‍රගතිශීලී හා ප්‍රජාතන්ත්‍ර ධාරනාවක්, ඔහුට මුලුමනින් ම ලබා දෙයි. දෙවනුව, මෙම සමානකරනය, වහල් ක්‍රමයට එරෙහි අරගලය සහ සංගමය රැක ගැනීම මත කෙන්ද්‍රගත වූ, ප්‍රගාඪ වසයෙන් ම ප්‍රජාතන්ත්‍රවාදී හා අවසාන වසයෙන් විප්ලවවාදී න්‍යාය පත්‍රයක් දේහානුරූප කල ලින්කන්ගේ හා ඔහුගේ ආන්ඩුවේ ඓතිහාසිකව ප්‍රගතිශීලී ස්වභාවය විකෘත කරයි හා පහත හෙලයි.

ඔබාමාගේ කැබිනට් මන්ඩලය සම්බන්ධයෙන් “ප්‍රතිවාදීන්ගේ කන්ඩායම” යන පදය යොදා ගැනීම රදා පවතින්නේ, තේරී පත් වූ ජනාධිපති රාජ්‍ය ලේකම් ලෙස ඩිමොක්‍රැටික් ජනාධිපති අපේක්ෂකත්වය සඳහා තරඟයේ දී සිය ප්‍රධාන විරුද්ධවාදිනිය වූ හිලරි ක්ලින්ටන් තෝරා ගැනීම සහ ආරක්ෂක ලේකම් තනතුරේ බුෂ් ආන්ඩුවේ රොබර්ට් ගේට්ස් දිගට ම තබා ගැනීමේ ඔහුගේ තීන්දුව මත ය. කලින් ප්‍රියතම අපේක්ෂකයා වූ ක්ලින්ටන් පරදමින් ඔබාමා අපේක්ෂකත්වය දිනා ගත්තේ, ඉරාක ආක්‍රමනය සඳහා ඇය දුන් සහයෝගයේ දී “ඇයට වැරදුනු” බව දිගින් දිගට ම ඡන්දදායකයන්ට මතක් කරමින් සහ යුද්ධය ඉක්මන් අවසානයකට ගෙන එනු ඇති අපේක්ෂකයා ලෙස තමාව ඉදිරිපත් කර ගනිමින්, ඩිමොක්‍රැටික් ඡන්දදායකයන් අතරත් සමස්තයක් ලෙස මහජනතාව අතරත් ඉරාක යුද්ධය කෙරෙහි පැවති පුලුල් විරුද්ධත්වයට ආයාචනා කිරීම මගිනි. ඔහු ඉන් අනතුරුව මහ මැතිවරනය ජය ගත්තේ, බුෂ් පාලනාධිකාරයේ මිලිටරිවාදී විදේශ පිලිවෙතත් එහි සංගත-ගැති හා ප්‍රජාතන්ත්‍ර විරෝධී දේශීය න්‍යාය පත්‍රයත් ඡන්දදායකයන් විසින් බලගතු ලෙස ප්‍රතික්ෂේප කරනු ලැබීමක පදනම මත ය.

ගේට්ස්, සුන්නි ප්‍රතිරෝධය ලේවල ගිල්වූ සහ රටේ දැවැන්ත ප්‍රදේශ ජනවාර්ගික ශුද්ධ කිරීමකට ලක් කල ඉරාකයේ එක්සත් ජනපද හමුදා පිරිස් බලය “ඉහල නැංවීමේ වැඩපිලිවෙල” ක්‍රියාවට දැමීම අධීක්ෂනය කලේ ය. එක්සත් ජනපද හමුදා ඉවත් කර ගැනීමේ මොන යම් හෝ කාල සටහනකට ඔහු ප්‍රසිද්ධියේ විරුද්ධ වී තිබේ.

එනයින් ගත් කල, ඔබාමා සිය ඉහල කැබිනට් තනතුරුවලට පත් කරන පුද්ගලයන් නියෝජනය කරන්නේ, ඔහුගේ මැතිවරන ව්‍යාපාරයේ පූච්චානම් ලැජ්ජා විරහිත ලෙස ප්‍රතික්ෂේප කිරීමකි, “වෙනසක්” පොරොන්දු වූ අපේක්ෂකයාගේ ජයග්‍රහනය වඩා හොඳ වෙනසක් යථා වසයෙන් ම සංඥා කරනු ඇතැයි ඔවුන් විශ්වාස කල හෝ බලාපොරොත්තු වූ නිසා ඔහුට ඡන්දය දුන් මිලියන සංඛ්‍යාත කම්කරුවන්ට හා තරුනයන්ට ගැසූ කම්මුල් පහරකි, ඔහුගේ පාලනාධිකාරය සියලු අත්‍යවශ්‍ය අංශයන්හි දී, බුෂ් පාලනාධිකාරයේ අධිරාජ්‍යවාදී හා යුදවාදී පිලිවෙත් අඛන්ඩව ඉදිරියට ගෙන යන බවට පාලක ප්‍රභූවට දුන් පැහැදිලි සංඥාවකි.

මෙය ලින්කන්ගේ ප්‍රවිෂ්ඨයට සමාන නොවනවා පමනක් නොව, එහි ප්‍රතිවිරුද්ධයයි. ලින්කන් ප්‍රධාන කැබිනට් තනතුරුවලට තෝරා ගත් පුද්ගලයන් 1860 රිපබ්ලිකන් පක්ෂ අපේක්ෂකත්වය සඳහා තරගයේ දී ඔහුගේ ප්‍රතිවාදීන් වුවත්, ඔවුහු, කිසිඳු අයුරකින්, ඔහුගේ මැතිවරන ව්‍යාපාරයේ කේන්ද්‍රීය මූලධර්මවලින් සහ ඔහුගේ ඡන්දදායකයන්ගේ අභිලාෂයන්ගෙන් -- එනම්,

ජනපද සංගමය රැක ගැනීම සහ වහල් ක්‍රමය ප්‍රසාරනය වැලැක්වීම -- පසුබැසීමක් නියෝජනය නොකලේය. රාජ්‍ය ලේකම් ලෙස විලියම් සෙවාර්ඩ්, භාන්ඩාගාර ලේකම් ලෙස සැල්මන් චේස් සහ නීතිපති ලෙස එඩ්වඩ් බේට්ස් මෙම පත්කිරීම්වලට ඇතුලත් විය.

ලින්කන් තරුන රිපබ්ලිකන් පක්ෂය තුල ප්‍රමුඛත්වයට නැග ගත්තේ, නව ජනපදවලට හා බටහිර භූමි ප්‍රදේශවලට වහල් ක්‍රමය ප්‍රසාරනය කිරීමට එරෙහි පුලුල් මහජන මනෝගතියට දේශපාලන හඬක් සම්පාදනය කිරීම මගිනි. බොහෝ සෙයින්, වහල් ක්‍රමය සම්බන්ධිත තීරනාත්මක දේශපාලන ගැටලු පැහැදිලිව ඉදිරිපත් කිරීම පිලිබඳ ඔහුට පැවති සහජ ඥානය නිසා, ඔහු 1860 රිපබ්ලිකන් ජනාධිපති අපේක්ෂක තරගයේ දී සෙවාර්ඩ් (නිව් යෝර්ක්හි සෙනෙට් සභික) හා චේස් (ඔහියෝ ජනපදයේ ආන්ඩුකාර) වැනි වඩා ප්‍රමුඛ දේශපාලනඥයන් පරාජය කලේය. එහෙත් අනේක දේශපාලන හා පුද්ගලික මතභේද තිබිය දී ම, සෙවාර්ඩ්, චේස් සහ ලින්කන් සිය කැබිනට් මන්ඩලයට තෝරාගත් සෙසු සියලු ම පුද්ගලයෝ රිපබ්ලිකන් පක්ෂයේ කේන්ද්‍රීය අරමුන -- ජනපද සංගමය රැකගැනීම සහ දකුනුදිග වහල් හිමියන්ගේ කැරැල්ල පරාජය කිරීම -- බෙදාහදා ගත්හ.

1860 මැතිවරනයේ දී ඩිමොක්‍රැටික් පක්ෂයේ උතුරුදිග කන්ඩායම නියෝජනය කල හා වහල් ප්‍රශ්නය සම්බන්ධයෙන් දකුනුදිග ප්‍රභූවට තව දුරටත් සහන දීම වෙනුවෙන් පෙනී සිටි ඉලිනොයිස් සෙනෙට් සභික ස්ටීවන් ඩග්ලස් සහ වහල් ක්‍රමය ප්‍රසාරනය කිරීමට පක්ෂ වූ, ඩිමොක්‍රැටික් පක්ෂයේ දකුනුදිග කන්ඩායමේ අපේක්ෂක, ජෝන් සී. බ්‍රෙකින්රිජ් වැනි, මූලික ප්‍රතිපත්තිමය ප්‍රශ්නවල දී තමන් සමග එකග නොවුනු ප්‍රතිවාදීන්ට ලින්කන් සිය කැබිනට් මන්ඩලයට ආරාධනා නොකලේය. ඔබාමාගේ නරුමත්වයට ගැලපීමට නම්, ලින්කන් ඩග්ලස් රාජ්‍ය ලේකම් ලෙසත් බ්‍රෙකින්රිජ් යුද ලේකම් ලෙසත් පත් කල යුතුව තිබුනි.

ඔහු සිය කැබිනට් මන්ඩලයට පත් කල "ප්‍රතිවාදීන්" සියල්ලෝම, වහල් ක්‍රමය කෙරෙහි ඔහු දැක්වූ සතුරුභාවයත් අවශ්‍ය නම් අවි බලයෙන් හෝ වහල් ක්‍රමයට ගැති බලවේග පරාජය කිරීමට ඔහුට පැවති අධිෂ්ඨානයත් බෙදාහදා ගත්හ. 1850 ගනන්වල දී සෙනෙට් සභිකයකු වසයෙන්, සෙවාර්ඩ් වහල් ක්‍රමයේ වඩාත් ම ප්‍රකාශිත විරුද්ධවාදියකු ලෙස ගෞරවයක් දිනා ගත්තේය. වහල් ක්‍රමයේ ප්‍රසාරනයට අවසර දුන්, ප්‍රතිගාමී පලායිත වහල් නීතිය ස්ථිර කිරීම අනුමත කල 1850 සම්මුතිය ඔහු හෙලා දැක්කේය. එසේ කිරීමේ දී, සෙවාර්ඩ් ව්‍යවස්ථාවට වඩා "ඉහල නීතියකට" මතකයේ රැඳී සිටින ලෙස ආයාචනා කලේය. මහජන ස්වෛරී භාවයේ කඩතුරාව යටතේ නව ජනපද තුල වහල් ක්‍රමයට අවසර දුන් කැන්සාස්-නෙබ්‍රස්කා පනතට ඉක්බිතිව, ඔහු වහල් ක්‍රමය නම් කලේ, ඩග්ලස් සහ සෙසු උතුරුදිග ඩිමොක්‍රැටිකයන් කැමති වූ සම්මුති ආකාරයේ විධික්‍රම මගින් වලකාලිය නොහැකි "මැඩලිය නොහැකි ගැටුමක්" ලෙස ය.

මිසෞරි ජනපදයේ එඩ්වර්ඩ් බේට්ස් හිටපු විග් පාක්ෂිකයකු වූ අතර දිගු කාලයක් අර්ධ-විශ්‍රාමික සුවයෙන් ගත කිරීමෙන් පසුව ඔහු යලි දේශපාලන ප්‍රමුඛත්වයක් ලබා ගත්තේ යාබද කැන්සාස් ජනපදයට වහල් සේවය ප්‍රසාරනය කිරීමට දැක්වූ සිය විරුද්ධත්වයේ පදනම මත ය. ඔහු නීතිපති ලෙස තෝරා ගැනීමේ එල්ලය වූයේ, ලින්කන් ආන්ඩුවට සහ දකුනු ජනපදවල වහල් තන්ත්‍රයට එරෙහි එහි අරගලයට දේශසීමා ජනපද අතරින් සහයෝගය දිනා ගැනීමයි.

ලින්කන් කෙරෙහි චේස්ට පැවති ඊර්ෂ්‍යාව සම්බන්ධයෙන් කියර්න්ස් ගුඩ්වින් ලින්කන් බෙහෙවින් අවධාරනය කරයි. එහෙත් වහල් ක්‍රමයට චේස් දැක්වූ විරුද්ධත්වය කිසිදාක සැකයට භාජනය නොවීය. පැන ආ වහලුන් ඔවුන්ගේ ස්වාමීන්ට විරුද්ධව ආරක්ෂා කල තරුන ඔහියෝ නීතිඥයකු ලෙස දේශපාලන නමක් දිනා ගත් ඔහු රිපබ්ලිකන් පක්ෂයේ පූර්වගාමියකු වූ නිදහස්-භූමි පක්ෂයේ සමාරම්භකයෙක් විය. 1864 දී ඔහු භාන්ඩාගාර ලේකම් තනතුරෙන් ඉල්ලා අස්වීම ලින්කන් භාරගැනීමෙන් පසුව, ඔහු ඉක්මනින් ම චේස් ශ්‍රේෂ්ඨාධිකරනයේ අග විනිසුරු ලෙස පත් කලේ ය. එහිදී චේස් දුන් තීන්දු දකුනු ජනපද තුල ප්‍රතිනිර්මාන වැඩපිලිවෙල තහවුරු කලේ ය.

1860 රිපබ්ලිකන් ජනාධිපති අපේක්ෂකත්වය ජයගැනීමේ දී ලින්කන් සිය ප්‍රධාන ප්‍රතිවාදීන් වන සෙවාර්ඩ්, චේස් සහ බේට්ස් පරාජයට පත් කලේය. අනතුරුව, මහ මැතිවරනය ජයගැනීමෙන් පසුව, ඔහු ප්‍රධාන කැබිනට් තනතුරු භාර ගන්නා ලෙස ඔවුන්ට ආරාධනා කලේය. ඔහු එසේ කලේ, හුදෙක් ඔහු තීක්ෂන බුද්ධියකින් හෙබි දේශපාලනඥයකු නිසා නොව, රටේ අව්‍යාජ ප්‍රජාතන්ත්‍ර බලවේගවල අභිලාෂයන් පිටුපසින් රිපබ්ලිකන් පක්ෂයේ විවිධ කොටස් ඒකාබද්ධ කොට දකුනුදිග වැවිලිකරුවන්ගේ කැරලිකාරිත්වය තලා දමනු වස් වඩාත්ම හොඳ කොන්දේසි නිර්මානය කර ගැනීම ඔහුගේ පැතුම වූ නිසාය.

ලින්කගේ ප්‍රතිවාදීන්ගේ කන්ඩායමට ප්‍රතිකූලව, ඔබාමා තෝරා ගෙන ඇත්තේ, සිය මැතිවරන ව්‍යාපාරයේ පූර්වානම් ද ඔහුට ඡන්දය දුන් අති මහත් බහුතරයකගේ අභිලාෂයන් ද නරුම සහ පිලිකුල් සහගත ලෙස ප්‍රතික්ෂේප කිරීමේ තේරී පත්වූ ජනාධිපතිගේ පිලිවෙත දේහානුරූප කරන ප්‍රතිගාමීන්ගේ කන්ඩායමකි.

**ටොම් එලේ**

© www.wsws.org